**ශීර්ෂය 197 - නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනයශීර්ෂය 197 දරන නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 රෙගුලාසිය ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 197- නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම,කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.16 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. (දෙපාර්තමේන්තු කටයුතු සිදු කළ යුත්තේ හුදෙක් මූල්‍ය හා දෙපාර්තමේන්තු නියෝගවලට අනුකූලව පමණක් නොව, රාජ්‍ය කටයුතු ඉටු කිරීමේදී බලාපොරොත්තුවන අවංකභාවය පිළිබඳ උසස් තත්ත්වයන්ට අනුකූල බව) | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම | 2.4.1 |
| | | 2. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.13 |
| | | 3. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු | 2.15 |
| 127(1) (ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. අනුකූල නොවීම් | 2.14 |
| | | 2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.16 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.5(අ) |
| | | 2. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම | 2.5(ඊ) |

| | | | |
|---|---|---|---|
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | 1. වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම<br>2. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.6<br>2.12 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.9 (i) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.11 |

| | | | |
|---|---|---|---|
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | මූල්‍ය අක්‍රමිකතා ස්වභාවයේ ගනුදෙනු | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයන්

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

(ආ) පාසල් අධ්‍යාපනය අවසන් කරන සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට ඵලදායී රැකියා අවස්ථා පාදක කරගත් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම.

(ඇ) රැකියා වෙළඳපොල වෙනස්වන අවශ්‍යතාවන්ට සරිලන නිපුණතාවයෙන් පරිපූර්ණ ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා කාර්මික, තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව නවීකරණය කිරීම.

(ඈ) ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම.

(ඉ) වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ඊ) ව්‍යවස්ථාපිත ආයතනයන්ට පැවරී ඇති සියලුම විෂයයන්ට අදාල කාර්යයන් අධීක්ෂණය හා පසු විපරම් කිරීම.

(උ) රාජ්‍ය පෞද්ගලික සම්බන්ධතාවය තර කිරීම.

(ඌ) ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කිරීම.

## 2.2 කාර්යසාධනය

----------------

### 2.2.1 කාර්ය භාර්යයන් ඉටු නොකිරීම

----------------------------------

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 7කට අනුබද්ධව දිවයින පුරා ක්‍රියාත්මකව පවතින මධ්‍යස්ථාන 367 ක කාර්යසාධනය පිළිබඳව පහතසඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය වර්ධනය වී නොතිබීම**

අමාත්‍යාංශය යටතේ පුහුණු මධ්‍යස්ථානවල පවත්වනු ලබන පාඨමාලා 4,147ක් අතුරින් පාඨමාලා 1513ක් 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ප්‍රතීතනය කර නොතිබුණි. පාඨමාලා සඳහා අවශ්‍ය පුහුණු උපකරණ හා යටිතල පහසුකම් සංවර්ධනය වී නොතිබීම, විද්‍යාගාර නිසි පරිදි සකස්ව නොතිබීම හේතුවෙන් සිසුන්ට ගුණාත්මක පාඨමාලා ලබාදීමටවූ හැකියාව අවම වී තිබුණි.

**(ආ) පුහුණු පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගීත්වය ප්‍රමාණාත්මකව අඩුවීම**

අමාත්‍යාංශය යටතේ ඇති පුහුණු මධ්‍යස්ථානවල සිසුන් 5ට අඩු සංඛ්‍යාවක් සහිත පාඨමාලා 118 ක්ද, සිසුන් 6ත් 10ත් අතර සංඛ්‍යාවක් සහිත පාඨමාලා 273ක්ද පවතින බව නිරීක්ෂණය වූ අතර සිසුන් 15 කට අඩු සංඛ්‍යාවක් සහිත පාඨමාලා 612 ක් විය. සිසුන් වැඩි ප්‍රමාණයක් බඳවාගැනීමට අවශ්‍ය සියළු සම්පත් හා පහසුකම් සම්පාදනය කර තිබියදී එම සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු අවම කිරීම හා උපදේශකවරුන් පුහුණු කිරීම**

වෘත්තීය පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට හැකිවන පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවාගැනීම, ඉගැන්වීම්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා විෂය ක්ෂේත්‍රයට අදාලව ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් වලට සහභාගී වීමට අවස්ථාව ලබා දීම කලයුතු වුවද අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 367 ක පවත්වාගෙන යන පාඨමාලා සඳහා එසේ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව 2017 වර්ෂයේ දී 109,632 කට ආසන්න සිසුන් (ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය හා ජාතික ව්‍යාපාර කළමනාකරණ විද්‍යාලය හැර) පිරිසක් බඳවාගෙන තිබුණද එම සිසුන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණු කරුවන් බඳවාගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඇතැම් මධ්‍යස්ථාන වල අනුමත කාර්ය මණ්ඩලයේ කථිකාචාර්යවරුන් 752 ක ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

**(ඈ) වෘත්තීය පුහුණු පාඨමාලා පිළිබඳව සමාජීය දැනුවත් කිරීම**

වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ කාර්යයක් වී තිබුණි. පාඨමාලා සඳහා සිසුන් ආකර්ෂණය කර ගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඉ)　　පාඨමාලා සම්පූර්ණ කරන ලද සිසුන් පිළිබඳව පසු විපරම් නොකිරීම**

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පුහුණු මධ්‍යස්ථාන බොහෝ ප්‍රමාණයකින් වෘත්තීය පුහුණුව අවසන් කළ පුහුණුලාභීන්ගේ රැකියාගත වීම සම්බන්ධව පසු විපරම්වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම පුහුණුලාභීන් රැකියාගත වීම පිළිබඳව දත්ත පද්ධතියක් නොමැති වීම නිසා දැනට පවත්වනු ලබන පාඨමාලා රැකියා පරිසරයට අනුකූලවීම පිළිබඳව සොයා බලා අවශ්‍ය නවීකරණය පිළිබඳ ඇගයීමක් කිරීමට අවස්ථා ඇති කර ගෙන නොතිබුණි. එමෙන්ම රාජ්‍ය මට්ටමින් වෘත්තීය පුහුණු ආයතන හා විදේශ රැකියා ආයතන සම්බන්ධීකරණය, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය (PPP)අවස්ථා හඳුනාගෙන සිසුන් රැකියාගත කිරීම, ස්වයං රැකියා සඳහා දායකත්වය ලබා දීම සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3　　ක්‍රියාත්මක කර තිබුණු විදේශාධාර ව්‍යාපෘති**

**-------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ ආධාර ව්‍යාපෘති 02 ක් සඳහා එකතුව රු.මිලියන 2733.49 ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 1564.76 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1168.73 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 42.7 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘති වර්ගය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු | සලසා තිබුණු ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|---|
| | | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| විදේශීය | කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | කොළඹ හා ගම්පහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 02 ක් පිහිටු වීම, සංවර්ධනය කිරීම, තාක්ෂණික මාරු කිරීම්, ආර්ථික සංවර්ධනයේ දී කොරියානු විශේෂඥයින්ගේ සහාය සහිතව කර්මාන්ත වර්ධනයට අනුබල දීම හා මානව සම්පත් සංවර්ධනයේ දී ප්‍රධාන කාර්යභාරයක් සිදු කිරීම. | 620.0 | 285.16 | 334.84 |
| විදේශීය | නිපුණතා ආංශික සංවර්ධන අංශය | රට තුළ කාර්මික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයේ ප්‍රතිපත්තිමය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණය සමඟ ප්‍රවේශය, අදාලත්වය, ගුණාත්මකභාවය සහ සමාජ අලෙවිකරණය වැඩි දියුණු කිරීම. | 2,113.49 | 1,279.60 | 833.89 |

## 2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

---

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 861.4 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 325.59ක් ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

### 2.4.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

---

**ආපනශාලා, ආරක්ෂක සහ පවිත්‍රතා සේවා සැපයීම**

---

(අ) අමාත්‍යාංශයේ ආපනශාලා, ආරක්ෂක සහ පවිත්‍රතා සේවා සැපයීමට අදාලව 2016/2017 වර්ෂය සඳහා භාෂාත්‍රයෙන් ප්‍රසම්පාදන දැන්වීම් පල කිරීමට 2016 මැයි රු.160,080 ක වියදමක් දරා තිබුණු අතර 2016 ජුනි 22 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු තීරණ පරිදි ඉදිරිපත් වූ ලංසුකරුවන් අතරින් ඉහත කී ආරක්ෂක හා පවිත්‍රතා සේවා සැපයීමට සුදුසු ආයතන තෝරාගත නොහැකි වූ බැවින් නැවත මාස 03 ක කාලයක් ඇතුළත නව මිල ගණන් කැඳවීමක් සිදු කිරීමට තීරණය කර තිබුණි. කෙසේවුවද ඉහත මිල කැඳවීමට අදාල ප්‍රසම්පාදන කමිටු තීරණය හා ආපනශාලාව පවත්වාගෙන යාමට අදාලව ලැබුණු ලංසුපත් ඇගයුම් කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2017 වර්ෂයට අදාලව 2016 ඔක්තෝබර් මස රු. 115,000 ක් වැයකරමින් නැවත මිල කැඳවීමක් සිදු කර තිබුණි. එහිදී 2016 දෙසැම්බර් 19 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය අනුව මූලික ලංසු කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් ආපනශාලා පවත්වාගෙන යාමට අදාලව ලැබුණු ලංසුපත් ප්‍රතික්ෂේප වී තිබූ අතර 2017 ජනවාරි 30 දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් නැවත මාස 03ක් ඇතුලත මිල කැඳවීමක් සිදුකිරීමටත් රු. 50,000 දක්වා ආපනශාලා බදුකුලිය වැඩිකිරීමටත් තීරණය කර තිබුණි. එහෙත් ඉහත තීරණ අනුව කටයුතු කර නොතිබුණු අතර ආරක්ෂක හා පවිත්‍රතා සේවා සැපයීමට අදාලව ලැබුණු ලංසුපත් ඇගයුම් කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. කෙසේ වුවද ඉහත අවස්ථා දෙකෙහිදී ප්‍රසම්පාදන දැන්වීම් පල කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව මාස 03ක් තුල මිලකැඳවීමක් සිදුව නොතිබුණු අතර 2018/2019 වර්ෂ දෙක සඳහා සුදුසු සේවා සපයන්නන් තෝරා ගැනීමට අදාලව 2017 නොවැම්බර් මිල කැඳවීමක් සිදු කර තිබුණි. ප්‍රසම්පාදන දැන්වීම් පල කිරීමට රු. 137,252 ක් වැයකර තිබුණු අතර මෙහිදී ආරක්ෂක හා පවිත්‍රතා සේවා සැපයීමට සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණද ආපනශාලාව සඳහා තෝරාගත් සැපයුම්කරු අමාත්‍යාංශයට සම්බන්ධ සේවකයෙකු බැවින් ප්‍රසම්පාදනය ලබා නොදීමටත් දෙවන ලංසුකරු පිළිබඳ තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවක් ලබාගැනීමටත් හා දැනට ආපනශාලාව පවත්වාගෙන යන ආයතනය වෙත නැවත මිලගණන් කැඳවා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගන්නා තෙක් සේවාව පවත්වාගෙන යාමටත් ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. කෙසේ වුවද ආපනශාලාව සඳහා වර්ෂය අවසානය තෙක් සැපයුම්කරුවෙකු තෝරාගැනීමට අමාත්‍යාංශයට හැකියාවක් ලැබී නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාහන උපයෝජනය**

-----------------------

.

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය සතුව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට වාහන 47 ක්පැවති අතර එම වාහන උපයෝජනය සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව වාහන අළුත්වැඩියා කිරීම් සම්බන්ධ ප්‍රසම්පාදනයන් සඳහා ලැබෙන මිල කැඳවුම් ප්‍රසම්පාදන කමිටුවක් වෙත යොමු නොකර විෂයභාර ලිපිකරු විසින් ටෙන්ඩර් මිල ගණන් විවෘත කර තාක්ෂණ නිලධාරී වෙත යොමු කර තිබුණු බව අනාවරණය විය. තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය අනුව සැපයුම්කරුවන් තෝරාගෙන ඒ සඳහා අනුමැතිය ලබාගෙන තිබුණි. මේ අනුව අමාත්‍යාංශය තුල වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් දුර්වල අභ්‍යන්තර පාලනයක් පැවති බව නිරීක්ෂණය විය.

(ii) ගරු අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම් විසින් භාවිතා කරන ලද මෝටර් රථය අළුත්වැඩියා කිරීම සඳහා කරන ලද ඉල්ලීමට අනුව දේශීය නියෝජිත ආයතනය රු. 755,072 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද එවැනි අළුත්වැඩියාවක් කිරීමට හේතුවූ කරුණු විගණනයට ඉදිරිපත් නොවිණි. ඒ අනුව රථය අළුත්වැඩියාව සඳහා 2013 නොවැම්බර් 07 දින යොමු කර අළුත්වැඩියාවක් සිදුකර ඇතත් මෙතෙක් බිල්පත ගෙවා නොතිබුණි. නැවත 2014 ජනවාරි 20 දින වාහනය ක්‍රියා විරහිත වීම හේතුවෙන් අළුත්වැඩියාව සඳහා නැවතත් උක්ත ආයතනයට 2014 අගෝස්තු 04 දින යොමු කර තිබුණු අතර අළුත්වැඩියාව සඳහා රු. 620,789 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. කෙසේවුවද එම අළුත්වැඩියාවන් සිදු කර නොතිබුණු අතර 2014 සිට මෙම රථය අළුත්වැඩියා කිරීමකින් තොරව ඉහත ආයතනයේ ගාල්කර තිබුණි. 2008 නිෂ්පාදිත රු.මි. 4.9 ක් වූ මෙම වාහනය දැනට වර්ෂ 04 ක් ධාවනයෙන් තොරව නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය වූ අතර වාහනය ගෙන්වා ගැනීම හෝ අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(iii) ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

----------------------------------------

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/16 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අයත් වාහන 47ක් සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂා කර නොතිබුණි.

(ආ) 2017 පෙබරවාරි 17 දිනැති අංක. 02/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අධිවේගී මාර්ගය භාවිතා කළ වාහන වෙනුවෙන් අදාල ගාස්තු ප්‍රතිපූර්ණය කළ හැකි වන්නේ ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ පූර්ව අනුමැතිය ලබා ගෙන ඇත්නම් පමණි. එහෙත් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ රාජකාරි සඳහා අධිවේගී මාර්ගය භාවිතා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපූර්ණය කරන ලද රු. 81,150 ක් වූ ගාස්තු සම්බන්ධයෙන් පූර්ව අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

**(ඇ) වෙන්කල හා සංචිත වාහන උපයෝජනය**

**--------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කල හැකි උපරිම නිල වාහන (මෝටර් රථ/ ජීප්/ ඩබල් කැබ්) සංඛ්‍යාව 03ක් වුවත් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් වාහන 04ක් වෙන්කර තිබුණි.

(ii) 2017 මාර්තු 24 දින රු. 39,283,600 කවටිනාකමකට රාජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් මිලදී ගෙන තිබුණුමෝටර් රථය මිළදී ගැනීමට අදාල කොන්දේසි අනුව රාජ්‍ය අමාත්‍යවරයා එවකට භාවිතා කරන ලද මෝටර් රථය මුදල් අමාත්‍යාංශය වෙත ආපසු භාරදිය යුතුව තිබුණද එසේ කර නොතිබුණි. කෙසේ වුවද රාජ්‍ය අමාත්‍යවරයා මාරුවීමේදී මෙම වාහන දෙක වෙනත් අමාත්‍යාංශයකට රැගෙන ගොස් තිබුණු අතර අමාත්‍යාංශයේ නමින් පවතින උක්ත වාහන සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) 2010 අප්‍රේල් 29 දිනැති අංක 146 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරවනව අමාත්‍ය මණ්ඩලය පත්වීමට පෙර පැවති අමාත්‍යාංශයන්හී සියළුම අමාත්‍යවරුන්ගේ/ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩල වෙත ලබා දී තිබූ සියළු වාහන ආපසු අදාල අමාත්‍යාංශය වෙත භාර දිය යුතු වුවත් 2017 මැයි මස සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධනයෙන් පසු අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත ලබාදී තිබූ වාහන 04ක් අමාත්‍යාංශය වෙත මෙතෙක් භාර දී නොතිබුණි.

**(ඈ) වාහන අපහරණය කිරීම**

**--------------------------**

භාණ්ඩාගාර ලේකම්ගේ 2015 මාර්තු 31 දිනැති අංක 2/2015 ජාතික අයවැය චක්‍රලේඛයෙහි 07 වගන්තියේ දක්වා ඇති පරිදි මු.රෙ. 756 (4) ප්‍රකාරව අමාත්‍යාංශය සතු අළුත්වැඩියා කලයුතු තත්වයේ පවතින හා භාවිතයෙන් තොරව අපහරණය කල යුතු තත්ත්වයේ පැවති වාහන 06 ක් සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර අපහරණය සඳහා සුදුසු වාහන හඳුනා ගැනීම පිළිබඳ ක්‍රියාමාර්ග ගතයුතු වුවත් විගණිත දිනය වන 2018 අප්‍රේල් 20 දිනය තෙක් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඉ)** 2015 මාර්තු 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව වෙනත් ආයතන වෙත මාරු කල නොහැකි වුවත්, එවැනි අනුමැතියකින් තොරව කල්බදු ක්‍රමය මත අත්පත් කරගෙන තිබූ වාහන 03ක් අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරුන් විසින් අමාත්‍ය මණ්ඩල සංශෝධනයෙන් පසු නව අමාත්‍යාංශ වෙත රැගෙන ගොස් තිබුණි.

**(ඊ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

**-------------------------------------------------------------------**

1996-2012 වර්ෂයන්හි සිට අමාත්‍යාංශය භාවිතා කරන විවිධ ආයතනවලට අයත් වාහන 04ක් මෙතෙක්අමාත්‍යාංශ වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. 2017 වර්ෂයේ පත්වුණු නියෝජ්‍ය අමාත්‍යවරයා රැගෙන එන ලද අමාත්‍යාංශ දෙකකට අයත් වාහන 08ක් පවරාගැනීම සම්බන්ධයෙන් මෙතෙක් කටයුතු කර නොතිබුණි.

**(උ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**---------------------------------------------**

අමාත්‍යාංශය සතු වාහන 20 ක් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණි.

**2.6 බැඳීම් හා බැරකම්**

**---------------------**

මුදල් රෙගුලාසි 94 (i) වගන්තියට පටහැනිව අනුමත ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳීම හේතුවෙන් වැය විෂයයන් 13කට අදාලව එකතුව රු. 2,327,004 ක් ප්‍රතිපාදන ඉක්මවා වියදම් කර තිබුණි.

**2.7 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

**-------------------------------------------**

**(අ)** සමාලෝචිත වර්ෂය තුළ වාහන අළුත්වැඩියා වෙනුවෙන් අමාත්‍යාංශය විසින් රු. 5,228,398 ක මුදලක් දරා තිබූ අතර 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය ප්‍රකාරව හා ප්‍රසම්පාදන අත්පොතේ 2.14.1 ඡේදය ප්‍රකාරව වැඩ සහ සේවා සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තරඟකාරීත්වයකට යොමු කර සුදුසු සැපයුම්කරු තෝරාගත යුතු වුවද අමාත්‍යාංශයේ වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. වටිනාකමින් වැඩි අළුත්වැඩියා වියදම් නියැදියක් ලෙස ගෙන විගණනය විසින් කරන ලද වැඩිදුර පරීක්ෂාවේදී අළුත්වැඩියා සඳහා අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනයේදී යොදාගන්නා ලද මිල කැඳවුම්වලට අදාල ආයතන 02 ක් එම ආයතන විසින් මිලගණන් ඉදිරිපත් නොකරන ලද බව විගණනයට තහවුරු කරන ලදී. ඒ අනුව එකී ආයතනයන්හි ලිපිශීර්ෂ අනුව සකස් කරන ලද මිල කැඳවුම් භාවිතා කර අවස්ථා 05 කදී රු.1,124,199 ක ප්‍රසම්පාදනයන් සිදුකර තිබූ බව විගණනයේදී අනාවරණය විය.

(ආ) 2017 අගෝස්තු 10 දින ගරු නියෝජ්‍ය අමාත්‍යවරයාගේ මාධ්‍ය ලේකම් වෙත අනුයුක්ත කල රථය අනතුරකට ලක් ව තිබූ අතර එහි අළුත්වැඩියාව සඳහා නියෝජිත ආයතනයේ ඇස්තමේන්තු ගත මුදල රු. 5,076,860 ක් වීම හේතුවෙන් මිල ගණන් සඳහා රක්ෂණ සමාගම එකඟ වී නොතිබුණු අතර ආයතන 04 කින් ටෙන්ඩර් මිල ගණන් කැඳවූ බවට තොරතුරු ලිපිගොනුවෙහි ඇතුලත් කර තිබුණි. ඉන් එක් ආයතනයක් වාහනය අළුත්වැඩියාව සඳහා යොමුකල ආයතනය සම්බන්ධිත ආයතනයක් බව විගණනයේදී අනාවරණය වූ අතර තවත් ආයතන 02 කින් ලබාගත් මිල කැඳවුම් ද ව්‍යාජව සකස් කරන ලද මිල කැඳවුම් බව විගණනයේදී අනාවරණය විය. කෙසේවුවද රු. 1,388,225 ක මුදලකට වාහනය අළුත්වැඩියාව සඳහා යොමුකර තිබූ අතර ප්‍රසම්පාදනය තරඟකාරීත්වයකට යොමු නොකිරීම 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව ක්‍රියාකිරීමක් බව නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රසම්පාදනය තුලින් උපරිම ආර්ථික වාසි ලබාගැනීමට හා සුදුසුකම්ලත් පාර්ශවයන්ට ප්‍රසම්පාදනය සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. මේ හේතුවෙන් ප්‍රසම්පාදනයේ අරමුණු ඉටුවී නොතිබුණු අතර වාහන අළුත්වැඩියාව සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලනයක් නොතිබීම හේතුවෙන් මෙවැනි අක්‍රමිකතා සිදුව තිබූ බව විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය.

## 2.8 තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන තිරසර සංවර්ධන පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව අමාත්‍යාංශය තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟා විය යුතු දර්ශකයන්, සන්ධිස්ථානයන් හා ඉලක්ක මත ලඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම අමාත්‍යාංශය තිරසර සංවර්ධන අරමුණක් ලෙස සංයුක්ත හා සමානාත්මතාවෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කරමින් "සැමට ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා උදා කර දීම" හඳුනාගෙන තිබුණද, එකී අරමුණ ඉටුවන ආකාරයට වර්ෂය තුළ ව්‍යාපෘතීන් සැලසුම් කොට නොතිබුණි.

## 2.9 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 2,878.83 | 2,719.57 | 159.26 | 5.53 |
| | මූලධන | 4,343.70 | 2,059.45 | 2,284.25 | 52.59 |
| | **එකතුව** | **7,222.53** | **4,779.02** | **2,443.51** | **33.83** |
| 2014 | පුනරාවර්තන | 3,801.12 | 3,769.19 | 31.93 | 0.84 |
| | මූලධන | 4,737.30 | 3,772.40 | 964.90 | 20.37 |
| | **එකතුව** | **8,538.42** | **7,541.59** | **996.83** | **11.67** |
| 2015 | පුනරාවර්තන | 2,889.49 | 2,849.06 | 40.43 | 1.40 |
| | මූලධන | 5,909.22 | 3,599.08 | 2,310.14 | 39.09 |
| | **එකතුව** | **8,798.71** | **6,448.14** | **2,350.57** | **26.71** |
| 2016 | පුනරාවර්තන | 3,678.25 | 3,412.71 | 265.54 | 7.22 |
| | මූලධන | 7,421.85 | 4,526.32 | 2,895.53 | 39.01 |
| | **එකතුව** | **11,100.10** | **7,939.03** | **3,161.07** | **28.48** |
| 2017 | පුනරාවර්තන | 4,570.51 | 3,926.66 | 643.85 | 14.09 |
| | මූලධන | 3,910.53 | 2,298.41 | 1,612.12 | 41.23 |
| | **එකතුව** | **8,481.04** | **6,225.07** | **2,255.97** | **26.60** |

(අ) **විසර්ජන ගිණුම**

(i) **සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

(a) සමාලෝචිත වර්ෂයට අදාල මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 8,481,043,600 ක් වූ අතර ඉන් රු. 6,225,071,146 ක් වර්ෂය තුළ වැය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය සියයට 27 ක් වූ අතර සියයට 41 ක් වූ මූලධන ප්‍රතිපාදනයේ ඉතිරිය ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(b) 2017 අයවැය යෝජනා යටතේ මාතර ජර්මන් පුහුණු පාසැල හා හෝටල් පාසැල වැඩිදියුණු කිරීම සඳහා වැය විෂය අංක 197-02-03-37-2104 සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු. 200,000,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, අමාත්‍ය මණ්ඩල සංශෝධනයෙන් පසු එම ප්‍රතිපාදන කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා යෙදවීමට 2017 සැප්තැම්බර් මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද වර්ෂය තුල ඉදිකිරීම් කාර්ය ඉටු නොකිරීම නිසා මුළු මුදලම ඉතිරි වී තිබුණි.

(c) වැය විෂයයන් 02 ක් යටතේ වෙන් කර තිබූ එකතුව රු. 300,250,000 ක් වූ ප්‍රතිපාදනවලින් යන්ත්‍ර සහ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදිත රු. 250,000 මුදලින් සියයට 70කට වැඩි ප්‍රමාණයක් ඉතිරි කර තිබුණු අතර විධිමත් සැලසුමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් 2017 අයවැය යෝජනා යටතේ ඇඟලුම්, සෞඛ්‍ය රක්ෂණ, ආගන්තුක සත්කාර හා ඉදිකිරීම් යන ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබන සිසුන්ට දීමනා ගෙවීම වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු මගින් සලසන ලද රු. මිලියන 300 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 26.8 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව ප්‍රතිපාදිත මුදලින් රු. මිලියන 273.2 ක් එනම් සියයට 91 ක් එම කටයුත්ත වෙනුවෙන් යෙදවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**2.10** 2104 වැය විෂය යටතේ සලසා තිබූ රු.මිලියන 820 ක් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් රු. මිලියන 535 ක් එනම් සියයට 65 ක්ම උපයෝජනය කර නොතිබුණි.

**2.11** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 19701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 28.0 | 22.9 | 10.0 | 15.6 | 80.0 | 52.5 |

**(අ) හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 415,750 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ පහකට වඩා වැඩි කාල සීමාවක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 2.12 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 38.9 ක් විය. ඉන් වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. මිලියන 23.66 ක් වූ තැන්පතු 36 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.13 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසි | නිරීක්ෂණ |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීන කර නොතිබුණි. |
| නිවාඩු පිළිබඳ ලේඛන | ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 1.7 | යාවත්කාලීන කර නොතිබුණි. |
| ධාවන සටහන් පොත් | මුදල් රෙගුලාසි 1645 | විධිමත්ව පවත්වා නොතිබුණි. |
| වාහන සම්බන්ධ සටහන් | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 වගන්තිය | පවත්වා නොතිබුණි. |

## 2.14 අනුකූල නොවීම්

### 2.14.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 104 (3) | - | රජයේ දේපලකට සිදුවූ අලාභහානිය පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කිරීමට වහාම කටයුතු කල යුතු වුවද 2016 හා 2017 වර්ෂයන්වල අවස්ථා 04කදී අමාත්‍යාංශය එසේ කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. |
| (ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 2017 නොවැම්බර් 07 දිනැති අංක 22/99 (XXXIII) දරනරාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සඳහා යොදවා ඇති වාහන රාත්‍රී කාලයේදී නවතා තැබිය යුතු ස්ථාන ආයතන ප්‍රධානියා විසින් නියම කරනු ලැබූ එකක් විය යුතු වුවද නියැදි පරීක්ෂාවේදී අමාත්‍යාංශයේ කණ්ඩායම් ප්‍රවාහනය සඳහා යොදා ගන්නා වාහන 02ක් අවස්ථා 04 කදී දින 02 සිට දින 16 දක්වා වූ කාලයක් අමාත්‍යාංශ භූමියේ නවතා නොතිබුණු බව අනාවරණය විය. කෙසේවුවද 2017 අගෝස්තු 30 විගණිත දින වනවිටත් එම වාහන වෙනත් ස්ථානයක නවතා තැබීමට අවශ්‍ය පූර්ව අනුමැතිය ද ලබා ගෙන නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් ඔබගේ අවධානය මු.රෙ.128 (1) (ඉ) කෙරෙහි යොමු කරවමි. |
| 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | | චක්‍රලේඛයට පටහැනිව හිටපු අමාත්‍යවරයා වෙත දුරකථන 04 ක් ලබා දී තිබුණි.ඒ අනුව චක්‍රලේඛ සීමාවන් ඉක්මවා ස්ථාවර දුරකථන තුනක් සඳහා මාසික හා ස්ථාවර ගාස්තු සඳහා අතිරේක වැයක් දැරීමට අමාත්‍යාංශයට සිදුව තිබුණි. |

**2.14.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

**උපයන විට බදු ගෙවීම් පරීක්ෂාව**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 ජුලි 06 දිනැති අංක SEC/ 2015/ 04 දරන ආදායම් බදු දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව උපයන විට ගෙවීමේ බදු ලෙස නිලධාරීන්ගෙන් මාසිකව අයකරගනු ලබන මුදල් ඊට පසු මාසයේ 15 දිනට පෙර ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල යුතු වුවද එසේ කර නොතිබුණි.

(ii) උක්ත චක්‍රලේඛයප්‍රකාරවප්‍රවාහන දීමනාවට හිමිකම් ලබන නිලධාරීන්ගෙන් රු. 50,000 ක් දක්වා පමණක් උපයන විට ගෙවීම් බද්දෙන් නිදහස් කළ හැකි අතර අනෙකුත් සියළුම දීමනා බද්දට යටත් වේ. කෙසේ වුවද, අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂය සඳහා දුරකථන හා ඉන්ධන දීමනා උපයන විට ගෙවීම් බදු අය කිරීම සඳහා අදාල කරගෙන නොතිබුණි.

**2.15 අභ්‍යන්තර විගණනය**

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ආයතන 10 කට අදාලව හඳුනාගත් විගණන ක්ෂේත්‍ර 22 ක් යටතේ විගණනය කිරීමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ විශේෂ විමර්ශන 05 ක් ඇතුළුව අභ්‍යන්තර විගණන වාර්තා 12 ක් පමණක් නිකුත් කර තිබුණි.

(ආ) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි ඉලක්ක සාක්ෂාත් කර ගැනීම, කාර්ය සාධනය, ගිණුම්කරණ, මූල්‍ය හා මෙහෙයුම් අංශයන්හි අභ්‍යන්තර පාලන ඇගයීම් වැනි ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණු අතර අභ්‍යන්තර විගණනය කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.

**2.16 මානව සම්පත් කළමනාකරණය**

**2.16.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 255 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 578,896 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 20 | 06 | - |
| (ii) | තෘතීයික මට්ටම | 03 | 02 | 01 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | ද්විතීයික මට්ටම | 435 | 374 | 61 | - |
| (iv) | වෙනත් මට්ටම | 44 | 43 | 01 | - |
| (v) | තාවකාලික | 04 | 01 | 03 | - |
| | | -------- | -------- | -------- | ------- |
| | එකතුව | 512 | 440 | 72 | 01 |
| | | ==== | ===== | ==== | === |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අනුමත කාර්යමණ්ඩලය බඳවා නොගැනීම**

තාත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් ද, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 01 ක්ද, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 61 ක්ද, වෙනත් හා තාවකාලික මට්ටමේ පුරප්පාඩු 04 ක්ද වශයෙන් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ පුරප්පාඩු 72 ක් පැවතුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ට නිදහස්කල මානව සම්පත්**

(i) නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය සඳහා 2017 ජුනි 02 දින සිට සංවර්ධන නිලධාරියෙකු හා ඒකාබද්ධ සේවයේ තනතුරු දරන නිලධාරීන් 06 දෙනෙකු ඇතුළු නිලධාරීන් 07 දෙනෙකු මුදා හැර තිබුණි. ඒ අනුව එම නිලධාරීන්ගේ වැටුප් හා වේතන ලෙස වර්ෂය තුල අමාත්‍යාංශයෙන් දරා තිබූ මුදල රු. 1,427,210 ක් විය.

(ii) 2017 සැප්තැම්බර් 11 දින ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ නිලධාරියෙකුද නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත නිදහස් කර තිබුණු අතර එම ආයතනයෙන් උක්ත නිලධාරියා වෙනුවෙන් වැටුප් හා වේතන ලෙස රු. 144,634 ක් ගෙවා තිබුණි.